**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2018**
**---------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ලිපි ද්‍රව්‍ය තොගය | 220,448 | 327,600 | 107,152 | රු.1,955 ක වන භෞතික තොග අතිරික්තය නිවැරදිව පොත් වල සටහන් කිරීමට කටයුතු කර ඇති අතර රු. 109,107ක් වන භෞතික තොග ඌණතාවය සඳහා 2018.12.28 දින මණ්ඩලීය පත්‍රිකා අංක 221/2018 යටතේ පෙන්වාදී ඇති අතර එහි තීරණය වී ඇත්තේ වගකිවයුතු නිළධාරීන්ගෙන් අයකර ගන්නා ලෙසටයි. ඒ අනුව මේ සඳහා කමිටුවක් පත්කර වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන 2019 මූල්‍ය වර්ෂය තුළදී සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | පිළිතුරු අනුව කටයුතු කිරීමට |
| (ආ) | පුරෝගාමී පාලන අධිකාරියේ ආදායම | 1,379,100 | 1,672,000 | 292,900 | මෙම වෙනසට හේතුව සොයා බලා වාර්තා කිරීමට සටහන් කර ගතිමි. | වෙනසට හේතුව සොයා බලා කටයුතු කිරීමට |

### 1.5.2 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම | 480,900 | වසර 5 | විගණනයෙන් පෙන්වා දී ඇති ශේෂය 2014 වර්ෂයේ දී සිදු කරන ලද ගිණුම්ය ගැළපීමක් තුළින් පැන නැඟෙන ලද ශේෂයකි. මෙය නිරවුල් කිරීම සඳහා අදාළ සියළුම ගිණුම් පරීක්‍ෂා කරමින් පවතින අතර මේ වන තෙක් සොයා ගත නොහැකි වූ බවත්,ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| විගණන විමසුම් | 15,940,525 | පිළිතුරු නොසැපයීම | අදාල විගණන විමසුම් දහය සඳහා ඉතා ඉක්මනින් පිළිතුරු සැපයීමට කටයුතු කරමි. | මාස 4 කට වැඩි කාලයක් පවතින විගණන විමසුම් සඳහා හැකි ඉක්මනින් පිළිතුරු ලබා දීමට |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,796,315 ක් වූ අත්තිකාරම් ශේෂයන් වසර 20 කට වඩා වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවති අතර එම ශේෂයන් කුමන වර්ෂයේ සිට පැවතෙන්නේද යන්න හඳුනා ගෙන නොතිබුණි. | මෙම ශේෂයන් හඳුනා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය යොදවා හැකිතාක් උත්සාහ ගත්තද ලිපිගොනු වල පවතින අඩුපාඩු හේතුකොට ගෙන මේ දක්වා හඳුනා ගත නොහැකිව පවතින බව දන්වමි. මේ සම්බන්ධව ඉදිරියේදී භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීමට සටහන් කරගත් බවද දන්වා සිටිමි. | නිශ්චිතව හඳුනාගෙන නිරවුල් කිරීමට |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 371 | දෙන ලද අත්තිකාරම් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත් වටිනාකම රු.386,670 ක් වූ අත්තිකාරම් වලින් රු.140,599 ක මුදලක් පියවීම සඳහා දින 30 සිට 85 දක්වා කාලයක් ගත කර තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. කෙසේ වෙතත් ඉදිරියේදී මු.රෙ. 371 ප්‍රකාරව කාර්ය නිම වූ විගසම පියවන ලෙස උපදෙස් ලබා දීමට සටහන් කර ගතිමි. එසේම අදාල නිළධාරීන් දැනුවත් කිරීමේ ලිපිය මේ සමඟ අමුණා ඇති අතර එසේ නොකරන නිළධාරීන්ගේ මාසික වැටුපෙන් අත්තිකාරම් මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | කාර්ය නිමවූ විගස අත්තිකාරම් පියවීමට |
| (ආ) i. 2008 අංක 01 දරණ මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීමට සම්මත කළ 2010 අංක 01 දරන පුරෝගාමී පාලන අධිකාරියේ නියෝග VI වැනි කොටසේ 28 (අ) වගන්තිය | සෑම ලියාපදිංචි වෙළෙන්දෙකු සහ අවසන් භාවිතාකරුවෙකු විසින්ම ඔවුන්ගේ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කරවා ගත යුතු අතර, ඔහු විසින් ඒ ලියාපදිංචිය ඉකුත් වන දිනට මසකට පෙරාතුව, නියෝගවල "ආ" උප ලේඛනයේ දක්වා ඇති පිළිවෙලින් 8 වැනි සහ 11 වැනි ආකෘතිවලට අනුව තත්කාර්ය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතරම, පනතේ I වැනි කොටසේ 6 (අ) වගන්තිය ප්‍රකාරව, ආනයනකරුවකුට හෝ අපනයනකරුවකුට නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක්ම වාර්ෂිකව අලුත් කළ යුතු අතරම, එවැනි සෑම ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින්ම බලපත්‍රය නිකුත් කරන ලැබූ දින සිට හෝ එහි යම් අලුත් කිරීමක් කරනු ලැබූ දින සිට වසරක කාලයක් ඉකුත්වීමට මසකට පෙරාතුව අධිකාරිය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද, එලෙස කටයුතු කර නොතිබූ අවස්ථා 12 නිරීක්ෂණය විය. | මීට අදාලව 2010 අංක 01 දරණ පුරෝගාමී පාලන අධිකාරියේ නියෝග සඳහා වූ ගැසට් පත්‍රයේ vi වැනි කොටසේ 29 වන වගන්තිය හා i වැනි කොටසේ 7 වගන්තිය අනුව පනත යටතේ නිකුත් කල යම් නියෝගයක් කඩ කරන අවස්ථාවකදී අධිකාරිය විසින් ලියාපදිංචිය/බලපත්‍රය අවලංගු කල හැකිය යනුවෙන් සටහන් කරන අතර එසේ වුවත් අවලංගු කිරීමට පෙර ඉල්ලුම් කල තැනැත්තාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දිය යුතු බවට සඳහන් වේ. ඒ අනුව එක් වරම ලියාපදිංචිය/බලපත්‍රය අවලංගු නොකර අදාළ බලපත්‍ර හිමි ආයතනයෙන් නිදහසට කරුණු විමසීම සිදුකරනු ලැබේ. දැනට අවසන් භාවිතාකරුවන් පෙර බලපත්‍රය කල් ඉකුත් | පිළිතුර අනුව අදාළ සාක්ෂි ලිපි ගොනුවට ඇතුලත් කිරීමට |

| | | | |
|---|---|---|---|
| | | වීමෙන් පසුව තමන්ට රසායනික ද්‍රව්‍ය අවශ්‍ය වන අවස්ථාවලදී පමණක් බලපත්‍රය සඳහා අයදුම් කරන අතර, බොහෝ අවස්ථා වලදී දිගු කලකට පසුව නැවත අලුත් කිරීමට ඉල්ලුම් කරන අවස්ථා වලදී ලිඛිත ප්‍රකාශයක් බලපත්‍ර හිමියාගෙන් ලබා ගැනීම සිදු කරනු ලබයි. බලපත්‍ර නිකුත් කිරීම කාර්යක්ෂම කිරීම සඳහා මේ වන විට මෘදුකාංග දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම අධිකාරිය විසින් සිදු කරමින් පවතී. | |
| ii. 2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ නියෝග | බලපත්‍රයක් ඉල්ලුම් කරමින් අයදුම්කරුවන් විසින් පුරෝගාමී පාලන අධිකාරිය වෙත ලබා දෙනු ලබන අයදුම්පත්වල අයදුම්පත ලැබුණු දිනය සටහන් කිරීමටත් අයදුම්පත පරීක්ෂා කරන නිලධාරියාගේ නම හා අයදුම්පත අනුමත කරන නිලධාරියාගේ නම සටහන් කිරීමට ඇති ස්ථාන සම්පූර්ණ කර නොමැති අවස්ථා අධිකාරියේ වගකිව යුතු නිලධාරියෙකුගේ නිසි පරීක්ෂාවන් හා නිසි අනුමැතියක් සහිත හෝ රහිත වන අයදුම්පත්වල අඩුපාඩු පැවතුණි. | අඩුපාඩුවක් බව අවබෝධ වීමෙන් පසුව නිසි පරිදි කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් හා පියවර ගෙන ඇති අතර සිදුවී ඇති දෝෂ සහගත තත්ත්වයන් අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කිරීමට |
| iii. 2008 අංක 01 දරණ මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීමට සම්මත කළ 2010 අංක 01 දරන පුරෝගාමී පාලන අධිකාරියේ නියෝග IV වැනි කොටසෙහි 15 වන වගන්තිය ප්‍රකාරව, පනතේ පළමු වන උපලේඛනයේ I වැනි වගුව සහ II වැනි වගුව | නිශ්චිතව සඳහන් කර ඇති යම් ද්‍රව්‍යයන්, සෑම බලපත්‍රලාභී ආනයනකරුවෙකු හෝ අපනයනකරුවෙකු විසින් පනතේ 'අ' උපලේඛනයේ දක්වා ඇති 5 වැනි ආකෘතියට අනුව ඒ ද්‍රව්‍යයන් ආනයනය, අපනයනය, භාවිතය, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිළිබඳ පිළිඹිබු කෙරෙන ත්‍රෛමාසික වාර්තා අධිකාරිය වෙත භාර දිය යුතු බව දක්වා තිබුණ ද , නිසි පරිදි ත්‍රෛමාසික වාර්තා ඉදිරිපත් කර නොමැති අවස්ථා පැවති බව නිරීක්ෂණය විය. | මේ වන විට එම ත්‍රෛමාසික වාර්තා නිසි ආකාරයෙන් ඊට අදාළ ලේඛනයක සටහන් කිරීම කරනු ලබයි. | නිසි කාලයට අදාල වාර්තා ඉදිරිපත් කිරීමට |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2009 අප්‍රේල් 04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009, 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009(I) සහ 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2017 | මෙම චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සෑම ආයතනයකම කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු බවට යෝජනා කර ඇතත් නවදිගන්ත මධ්‍යස්ථානයේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. | 2018.10.06 අකුණු සැර වැදීම හේතුවෙන් ඇඟිලි සළකුණු යන්ත්‍රය අක්‍රීය වූ අතර, අළුත්වැඩියා කිරීම සඳහා 2018.10.08 ආයතනය වෙත යවා ඇත. අනතුරුව 2019.05.13 දින මධ්‍යස්ථානයට ලැබුණු අතර එදිනම නැවත වතාවක් එය ක්‍රියාවිරහිත වී ඇත. එමෙන්ම පැමිණීම, පිටවීම නිවැරදි දෛනික අත්සන් ලේඛනයේ මධ්‍යස්ථාන කළමනාකරු ඉදිරිපිට හෝ උපදේශකයෙකු ඉදිරිපිට සටහන් කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට |
| (ඇ)i. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ - 2006 හි 4.2.1 (අ) හා (ඉ) වගන්තිය | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් ආයතනය විසින් පිළියෙල කරන ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂයට සීමා කර මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කරනු ලැබිය හැකි වුවත් 2018 වර්ෂය සඳහා 2018 ජනවාරි 30 අනුමත කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම මාස 10 කට ආසන්න කාලයක් තුළ එනම් 2018 නොවැම්බර් 29 දින දක්වා හත්වෙනි වතාවට සංශෝධනය අනුමත කර තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. ප්‍රසම්පාදන කටයුතු 2018/02/16 දින තෙක් පැවරී තිබුණේ පාලන අංශයට වන අතර ඉන්පසු කළමණාකරණ තීරණයක් මත එහි ප්‍රාග්ධන කොටස ගිණුම් අංශය වෙත පැවරිණි. ඒ අනුව විගණන විමසුමේ සඳහන් පරිදි සංශෝධනයන් සිදු කිරීමට වුයේ අත්‍යවශ්‍ය කරුණු විටින් විට පැන නැඟුණු බැවිනි. එසේම 2018 වර්ෂයේ සිට ඉදිරි වසර 03ක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර ඇත. | පිළිතුරු අනුව කටයුතු කිරීමට |

| | | | |
|---|---|---|---|
| ii. 2006 රජයේ රජයේ ප්‍රසම්පාදන සංග්‍රහයේ 8.12.3 (අ), (ආ), (ඇ) වගන්තිය | නියමිත පිරිවිතරවලට අනුකූලව ලද බවට බවට ස්ථාන භාර නිලධාරියා හෝ කාර්මික නිලධාරියෙකු පරීක්ෂා කර සහතික වීමක් නොමැතිව රු. 4,211,060 ක් ගෙවීම් කර තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. ඉදිරියේදී ප්‍රසම්පාදන කටයුතු නිවැරදි ලෙස කිරීමට කටයුතු යොදා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට |
| (ඉ) 2015 මැයි 25 දිනැති PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය | අනෙකුත් රාජකාරි සඳහා වාහන භාවිතයට අවසර ලබා දී නොතිබුණ අතර සභාපතිවරයා 2018 ජූනි මස සිට 2019 පෙබරවාරි මස දක්වා PF- 9007 දරණ වාහනය කි.මී. 12,334 දුර අනුමැතියකින් තොරව ධාවනය කර තිබුණි. | මේ පිළිබඳ පරීක්ෂා කිරීමට නීතිය හා සාමය අංශයේ අතිරේක ලේකම්ගේ අංක COPE/2019/01 දරණ 2019.05.27 දිනැති ලිපිය මඟින් කමිටුවක් පත් කර ඇති අතර එහි වාර්ථාව ලද පසු නිශ්චිත පිළිතුරක් ලබා දෙන බව පවසන ලදී. | චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 28,291,721 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 34,080,828 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,789,107 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අනෙකුත් මෙහෙයුම් වියදම් රු.13,343,161 කින් අඩුවීම රජයේ ප්‍රදාන රු 14,625,999 කින් වැඩිවීම සහ INGSA ප්‍රධාන රු.2,752,400 ක් ලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ ප්‍රජා පාදක කඳවුරු ව්‍යාපෘතිය යටතේ සැලැස්මකින් තොරව මිලදී ගන්නා ලද රු. 642,403 ක් වටිනා භාණ්ඩ නවදිගන්තය හා තලංගම මධ්‍යස්ථානයේ භාවිතයකින් තොරව ගබඩා කර තිබුණි. | 2017 වර්ෂයේ ප්‍රජා පාදක කඳවුරු ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගන්නා ලද භාණ්ඩ මධ්‍යස්ථානයේ අවශ්‍යතා මත ලබා දුන් අතර, අදාළ භාණ්ඩ අවශ්‍යතා මත භාවිත කළ බවත් ඉතිරි භාණ්ඩ සුරක්ෂිතව ගබඩා වල ඇති බවත් දන්වා සිටින අතර, එම භාණ්ඩ ද ඉදිරි කාලයේදී අවශ්‍යතා මත භාවිතයට ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | විනාශ වීමට ඉඩනොදී භාවිතයට ගැනීමට |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,594,165 ක් වියදම් කර 2016 පෙබරවාරි 05 දින නවදිගන්තය මධ්‍යස්ථානයේ අකුණු සන්නායක පද්ධතියක් සවි කරනු ලැබුවද වගකීම් කාලය තුලදී අක්‍රිය වී ඇතත් යථා තත්තවයට පත්ව නොතිබුණි. | මෙම මධ්‍යස්ථානය උස් භූමියක පිහිටා ඇති අතර මධ්‍යස්ථානය ඉදිරිපිට ලංකා විදුලිබල මණ්ඩලයේ 33300V ට්‍රාන්ස්ෆෝමරයක් සවි කර ඇති බැවින්ද ආයතනයේ පොල් වත්තක් තිබීම හේතු කොටගෙන මෙම ප්‍රදේශයට අධික වර්ෂා කාල වලදි අධික ලෙස අකුණු සැර වැදීම නිරන්තරයෙන් සිදු වන බව කාරුණිකව පෙන්වා දෙමි. මේ අනුව පොල්ගස් වලට අකුණු සැර වැදීම ද විදුලි ජේනු ගලවා ඉවත් කළද භාණ්ඩ වලට අකුණු සැර වැදීමද වසර ගණනාවක සිට සිදු වේ. අකුණු සැර වැදි විනාශ වූ භාණ්ඩ කිහිපයක් මේ වන විට අළුත්වැඩියා කර ඇති අතර අනිකුත් භාණ්ඩ අළුත්වැඩියා කිරීමට භාර දී ඇති බව දන්වමි. | අවශ්‍යතාවයන් හඳුනාගෙන නිවැරදි පිරිවිතරයන්ට අනුව මිලදී ගැනිම් සිදු කිරීමට |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නවදිගන්ත මධ්‍යස්ථානයේ 2018 වර්ෂයේ ප්‍රතිකාර සඳහා ඇතුළු වූ 432 ක් වූ සේවා ලාභීන් සංඛ්‍යාවෙන් 37 ක් දින 1 සිට 38 දක්වා කාලයක් ගත කර අනවසරයෙන් බැහැර වී තිබූ අතර තලංගම මධ්‍යස්ථානයේ 2017 වර්ෂයේ 15 දෙනෙකු පලාගොස් තිබුණි. මෙය ආයතනයේ ආරක්ෂක වැඩපිළිවෙල ප්‍රමාණවත් නොවීම, උපදේශනයන් මඟින් ඔවුන් රඳවා ගැනීමට ප්‍රමාණවත් උත්සහායක් නොගැනීම යන කරුණු පිළිබිඹු විය. | 2018 වර්ෂයේ ප්‍රතිකාර සඳහා ඇතුලත් වූ 432 ක් වූ සේවාලාභීන් සංඛ්‍යාවෙන් 37 දෙනෙක් දින 1 සිට 38 දක්වා කාලයක් ගත කර අනවසරෙන් බැහැරවී ඇත. ඒ සඳහා පහත සඳහන් හේතු බලපා ඇති බව කාරුණිකව පෙන්වා දෙමි.<br>ආයතනයේ ආරක්ෂාව සඳහා යොදවා ඇත්තේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු පමණි. ඔවුන් අක්කර 18 ක විශාලත්වයෙන් යුතු වත්ත හා ප්‍රධාන ඇතුල්වීමේ ගේට්ටුවේ ආරක්ෂාව භාරව කටයුතු කරයි. ප්‍රතිකාර කාර්යය මණ්ඩලයේ උපදේශන සහකාරවරු 22 දෙනෙකුගේ සේවය අවශ්‍ය මුත් දැනට සේවයේ නිරත වන්නේ උපදේශන සහකාරවරු 13ක් පමණි. ඉහත සඳහන් පරිදි ප්‍රමාණවත් උපදේශන සහකාරවරු නොමැතිවීම අනවසර බැහැරවීම් වලට බලපාන කාරණයකි. තවද අදාල නිළධාරීන් දෛනිකව සේවා මුර 3ක් සඳහා යෙදවිය යුතු බවද දන්වා සිටිමි. | ප්‍රමාණවත් ආරක්ෂක වැඩ පිළිවලක් යොදා ගැනීමට |
| (ආ) මණ්ඩලයෙහි තලංගම ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි ප්‍රතිකාර ලබාදෙන සේවාලාභීන්ගේ ලිපිගොනු 20 ක් පරීක්ෂාවේදී එම පුද්ගලයන් මත්ද්‍රව්‍ය භාවිතයට බොහෝ කාලයක් සිට යොමුවී තිබුණ අතර එම පුද්ගලයින් අවුරුදු 02 සිට අවුරුදු | මත්ද්‍රව්‍ය භාවිතය හා මානසික ඇබ්බැහිකාරි තත්ත්වයන් මත විවිධ පුද්ගලයන් විවිධාකාර වූ ප්‍රතිකාර, පුනරුත්ථාපනය ලබන අතර නැවත නැවත යොමු වීමේ ප්‍රවනතාවක් සමස්ථ ක්‍රියාවලිය තුල ඇති තත්ත්වයකි. විවිධ හේතු සාධක ඉදිරිපත් කරමින් නැවත නැවත යොමු වන අතර ඒ සියලු දෙනාට ප්‍රතිකාර හා පුනරුත්ථාපනය ලබා දීම අප සතු යුතුකමක් හා වගකීමක් වේ. | මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට කටයුතු කිරීමට |

| | | |
|---|---|---|
| 23 ක් දක්වා කාලයක් මත්ද්‍රව්‍ය භාවිතා කර තිබුණි. මෙම සේවාලාභීන්ගෙන් බොහෝ දෙනෙකු සමාජ අපරාධවල ගොදුරක් ලෙස මත්ද්‍රව්‍ය වලට යොමු වී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. මෙසේ දීර්ඝ කාලයක් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයන් දින 14 ක් හෝ මාස 02 ක් තුල පුනරුත්ථාපනය කර සමාජගත වීමෙන් නැවත නැවතත් ඔවුන් විසින් මත්ද්‍රව්‍ය භාවිතයට නිරන්තරයෙන්ම යොමුවේ. | | |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු. 330,484ක් වටිනා රසායන ද්‍රව්‍ය 37 ක තොග ශේෂයක් 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිකුත් කර නොතිබුණු අතර රු. 96,290 ක් වටිනා රසායන ද්‍රව්‍ය අයිතම 03ක් වර්ෂ 10 කට ආසන්න කාලයක් නිකුත් නොකර තොග ශේෂයේ පෙන්නුම් කර තිබූ හෙයින් රු. 2,527,499 ක්වූ තොග ශේෂයෙන් රු. 426,774 ක තොග ශේෂයන් එනම් සියයට 17 පමණ ප්‍රයෝජනයක් නොමැති තොග බව නිරීක්ෂණය විය. | ජාතික මාදක රසායනාගාරය විසින් මාදක, මනෝවර්ථක ද්‍රව්‍ය නීති විරෝධී ජාවාරමට එරෙහි අදාල පනත්වලට අනුව පනත යටතේ පාලනයට නතු ද්‍රව්‍ය 254 ක් ද, විෂ වර්ග ,අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග පනත යටතේ පාලනයට නතු ද්‍රව්‍ය 68ක් ද, ක්‍රීඩාවේදී භාවිත කරන තහනම් උත්තේජක ලෙස සැලකෙන පාලනයට නතු ද්‍රව්‍ය 180 ක්ද සඳහා මූලික පරීක්ෂණ මෙන්ම මූලික පරීක්ෂණවල ප්‍රතිඵල අනුව එම ප්‍රතිඵලයේ නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා තහවුරු කිරීමේ පරීක්ෂණ ද සිදු කරනු ලබයි. තවද ජාතික මාදක රසායනාගාරය අඛන්ඩව පවත්වාගෙන යනු ලබන ජාත්‍යන්තර රසායනාගාර ප්‍රමිතිකරණ වැඩසටහනට අදාල විශ්ලේෂණ සහ අදාල ආයතනවල අවශ්‍යතාවය මත දෛනිකව රසායනාගාරය වෙත යොමු කරන එම සැක සහිත සාම්පලයන් සඳහා ඉහත පරීක්ෂණ සිදු කිරිමට අවශ්‍ය රසායනිකයන් පරීක්ෂණයේ අවශ්‍යතාවය මත ප්‍රයෝජන ගැනීම රසායනාගාරය සතුව තිබීම අතවශ්‍ය වේ.<br>එබැවින්, ප්‍රයෝජනයක් නොමැති රසායන ද්‍රව්‍ය තොග 17% ක ප්‍රමාණය සහ කල් ඉකුත්ව ඇති රසායන ද්‍රව්‍ය 12 ද, 2000 වර්ෂයටත් පෙර සිදු කරනු ලැබූ විශ්ලේෂණ කටයුතු සඳහා මිල දී ගන්නා ලද අතර එවකට සිදු කරනු ලැබූ විශ්ලේෂණ සඳහා එම රසායන ද්‍රව්‍ය භාවිතා කල නමුත් දැනට සිදු කරනු ලබන නවීන යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් වඩාත් කාර්යක්ෂමව අඩු පිරිවැයක් යටතේ සිදු කරන | තොග ලේඛණය යාවත්කාලීන කිරීමට සහ යල් පැන ගිය තොග ඉවත් කිරීමට |

| | | |
|---|---|---|
| | පරීක්ෂණ සඳහා අවශ්‍ය නොවන හෙයින් මෙම රසායන ද්‍රව්‍යප්‍රයෝජනයට නොගැනෙන අතර භාවිතයෙන් ඉවත් කර ඇත.<br>තවද මෙම රසායන ද්‍රව්‍ය වලින් සමහරක් එවකට භාවිතා වී තිබුණත් පසු කාලයේදී එම රසායන ද්‍රව්‍ය භාවිතය මඟින් සිදුවන අහිතකර සෞඛ්‍ය තත්වයන් හඳුනා ගැනීමත් සමඟ රසායනාගාරය තුල භාවිතයෙන් ඉවත් කර ඇත. | |
| (ආ)කාර්ය සාධනය ක්ෂේත්‍රයන් 10 අතරින් මාදක සහ මනෝවර්ධක ද්‍රව්‍ය අඩංගු බවට නිගමනය කරන සාම්පල විශ්ලේෂණය, මත්ද්‍රව්‍ය පාලන ක්ෂේත්‍රය හා සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් හා අදාළ අනෙකුත් ආයතනයන් සඳහා කාර්යක්ෂමතා හා බුද්ධිමය වර්ධන වැඩසටහන, දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තිය ද්‍රව්‍ය හඳුනා ගැනිම සහ විශ්ලේෂණය කිරීම, මත්ද්‍රව්‍ය හා සම්බන්ධ නීති ක්‍රියාත්මක කරන ආයතන නිළධාරීන් සඳහා පවත්වනු ලබන පරිගණක පුහුණු වැඩසටහන්. නීතිය බලාත්මක කරන ආයතන සඳහා අවශ්‍ය වන ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටලවල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සහ නැවත සැකසීම යන ක්ෂේත්‍ර 5 ක කාර්යසාධනය අපේක්ෂිත මට්ටම ඉක්මවා තිබුණද වීථි හෙරෝයින්වල මිල සහ පිරිසිදුභාවය අනාවරණය කොට එහි ඇති සම්බන්ධතාවය සහ නව තනුකකරණ ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා සිදුකරන ලබන පර්යේෂණ ව්‍යාපෘතියෙහි කාර්යසාධනය සියයට 25 කටත් වඩා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | විදී හෙරොයින් මිල හා පාරිශුද්ධතාවය අතර සම්බන්ධතාවය හඳුනා ගැනීමට අදාළ විශ්ලේෂණය සහ නව තනුකකාරක අඩංගු බවට සිදු කරන විශ්ලේෂණයන් සඳහා සාම්පල ලබා දීම සිදු කරනු ලබන්නේ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මඟිනි. නමුත් පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය වෙත මේ සඳහා ලබා දුන් මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන විශ්ලේෂණය සඳහා ලැබුණු සාම්පල සංඛ්‍යාව ඉලක්ක ගත සාම්පල සංඛ්‍යාවේ අඩුවීමක් සිදු වූ බැවින් ප්‍රගතිය 25%කට වඩා අඩු මට්ටමක පැවතුනි. තවද මෙම වැඩසටහන සඳහා සාම්පල ලබා ගැනීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්‍ෂම කර ගැනීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලිසීය හා එවැනි නීතිය ක්‍රියාත්මක කරන අනෙකුත් ආයතන දැනුවත් කරන අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ. | කාර්ය සාධන මට්ටම වැඩි කිරීමට කටයුතු කිරීමට |
| (ඇ) 2008 අංක 01 දරන ඖෂධ හා මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීමට සම්මත කළ 2010 අංක 01 දරන පුරෝගාමී පාලන අධිකාරියේ | මේ සම්බන්ධයෙන් පුරෝගාමී පාලන අංශයේ අවධානය යොමුව තිබුණ නමුත් අවශ්‍ය මානව සම්පත් හිඟය හේතුවෙන් අවුරුද්දකට වරක් පරිශ්‍ර අධීක්ෂණ කටයුතු කරමින් පවතී. මීට අමතරව මෙම කාර්යයන් තවත් කාර්යක්ෂම කිරීම පිණිස මණ්ඩලයේ පාර්ශ්වකරුවන් වන පොලීසිය, සුරාබදු | නියමිත කාලය තුල නිසි අධීක්ෂනයක් සිදුකිරීමට |

| | | |
|---|---|---|
| නියෝග III වැනි කොටසේ 13 වන වගන්තිය ප්‍රකාරව අධිකාරියේ සාමාජිකයින් විසින් අවම වශයෙන් මාස තුනකට වරක්වත් බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ පනතේ නිශ්චිතව දක්වා ඇති ද්‍රව්‍ය භාවිතා කරමින් කරගෙන යන්නා වූ ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණය කළ යුතු වුවද එම නියෝග ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව වැනි ආයතන වල සහාය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සාකච්ඡා කරමින් පවතී. | |
| (ඇ) මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යනය 2016/2017 පර්යේෂණ වාර්තාව ප්‍රකාර මත්ද්‍රව්‍ය භාවිතා කරන වයස් කාණ්ඩ,වයස 14 ට අඩු සියයට 13ක්, වයස 15 – 19 ත් අතර සියයට 16 ක් හා වයස 20 – 24 ත් අතර සියයට 19 නියෝජනය විය. මෙහිදී පුද්ගලයකුගේ මුල් භාවිත වයස, එනම් අත්හදා බැලීමක් වශයෙන් එනම් කුතුහලය, ගැටලු අවස්ථාවලදී, මිතුරු බලපෑම, සතුට විනෝදය නිසා මුලින්ම භාවිතා කරන වයස නව යොවුන් විය හෝ ඊට පසු කාලය ලෙස සදහන් කර ඇත.මත්ද්‍රව්‍ය නිවාරක, පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන් හි සැළකිය යුතු ප්‍රතිශතයක් පාසල් ළමුන් ඉලක්ක කරගෙන සිදු විය යුතු වුවත් ශ්‍රී ලංකාවේ 10,102 ක් වූ සමස්ථ පාසල් සංඛ්‍යාවෙන් 2013 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් දක්වා පුහුණු වැඩසටහන් සිදු කර ඇති පාසල් සංඛ්‍යාව 2,719 ක් එනම්, සියයට 26 ක් තරම් අඩු ප්‍රතිශතයක් විය. | එම නිරීක්ෂණයෙන් දක්වා ඇති පරිදි පාසල් 10,102න් එනම් පාසල් 2,719ක් එනම් 26%කටත් අඩු තරම් සංඛ්‍යාවකට අප ළඟා වී ඇත යන්න සත්‍ය මුත් නිළධාරින් 14ක් යොදවා පාසල් 10,102ක් ආවරණය කිරීම ප්‍රායෝගික නොවූවකි. ඒ නිසා නිවාරක අධ්‍යාපන අංශය පාසල් ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් පුහුණුකරුවන් ලෙස පුහුණුකරයි. ඒ ඔස්සේ සිසුනට ආමන්ත්‍රණය කිරීමේ දැනුම ඔවුනට ලබා දෙයි. රාජ්‍ය නිළධාරින් දැනුවත් කිරීම ඔස්සේද චක්‍ර අයුරින් මේ කාර්ය සිදු වේ. මෙම ලේඛණය තුළ අඩංගුව ඇත්තේ ඍජුව අප නිළධාරින් සිදු කළ ක්‍රියාකාරකම් පමණක් වන අතර අනෙකුත් ක්‍රියාකාරකම් මෙහි නැත. | දැනුවත් කිරීමේ වැඩසටහන සෑම සිසුවකුටම ලැබෙන ආකාරයට කටයුතු කිරීමට |
| (ඉ) මත්ද්‍රව්‍ය අලෙවි සහ ජාවාරම් කිරීම් සම්බන්ධව සැළකීමේදී කාන්තාවන් ඊට යොමු වීමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක පවතින බැවින් කාන්තාවන් අලෙවිය සම්බන්ධයෙන් දක්වන | කාන්තාවන් ඉලක්ක වී ඇති වැඩසටහන් හා පුරුෂයින් ඉලක්ක වූ වැඩසටහන් ලෙස විභේදනයක් වාර්තාව තුළ නැත. සරල උදාහරණයක් ලෙස ප්‍රජා වැඩසටහන් යන ශීර්ෂය ගතහොත් ඒවා කාන්තාවන් මෙන්ම පුරුෂයන්ද ඉලක්ක වේ. (සෑම වැඩසටහනක දායකත්වය මෙය | නිවාරණ අධ්‍යාපන අංශය තුල පුහුණු වැඩසටහනෙහි කාන්තාවන් ඉලක්ක කරන වැඩසටහනක් වැඩි |

| | | |
|---|---|---|
| දායකත්වය අවම කර ගැනීමට කාන්තාවන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වුවත් කාන්තාවන් ඉලක්ක කර ගෙන සිදු කරන ලද නිවාරක අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පසුගිය වර්ෂ 5 තුළ නිරීක්ෂණය නොවිය. | වේ.) මෙහිදි ස්ත්‍රී පුරුෂ භූමිකාව (Gender) තුළින් මත්ද්‍රව්‍ය නිසා ඇතිවන වෙනස පමණක් නොව (Sex) ලිංගිකත්වය තුළ සිදුවන මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතාද විද්‍යාත්මක වැඩසටහන් ඇසුරින් ඉදිරිපත් කරන එකම ආයතනය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය බව නොපැකිළිව සඳහන් කරනු කැමැත්තෙමු. | ප්‍රමාණයක් සිදු කිරීමට |

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

-----------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හෝමාගම පිහිටි පිරිවැය රු.4,027,518 ක් වූ පර්චස් 40 ක ඉඩම 2014 අප්‍රේල් 30 දින 30 අවුරුදු බදු ක්‍රමයට මත් ද්‍රව්‍ය එන්නත් කර ගන්නා පුද්ගලයින්ට ප්‍රතිකාර කිරීමට හා ඔවුන්ව පුනරුත්ථාපනය කිරීම අරබයා මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම වසර 5 ක් තිස්සේ ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව තවදුරටත් නිශ්කාර්යව පැවැතුණි. | මෙම හෝමාගම ඉඩම අයත් ප්‍රදේශය මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ තාක්‍ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතියට අදාළව හඳුනා ගෙන ඇති බැවින් එහි ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට අවසර ලැබී නොමැත. මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අයත් වන අතර එම ඉඩම මණ්ඩලයට ලබා දීමේ බදු ගිවිසුම සකස් කිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ නීති අංශය වෙත යොමු කර ඇති බවට මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙන් අප වෙත දන්වා 2019.03.29 දින අංක 10/8/2745 දරණ ලිපිය මඟින් යොමු කර ඇත. එසේම නාගරික සංවර්ධන අධිකාරියෙන් බදු ගිවිසුම සකස් කිරීමට අදාළව නීති ගාස්තු ලෙස රු 82,142.20 ක මුදල ගෙවිය යුතු බව දන්වා අංක 13/1/1615 දරණ 2019.05.13 දිනැතිව ලිපියක් යොමු කර ඇත. | ඵලදායි කාර්යයකට යොදා ගැනීමට |
| (ආ) රු.3,884,160 ක් වියදම් කර තාක්ෂණික උපදේශක තහවුරුවක් නොමැතිව ස්ථාපනය කරන ලද LED වීඩියෝ පැනලය විගණිත දින වූ 2019 මාර්තු 12 දින වන විටත් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | මෙම වීඩියෝ පුවරුව සඳහා 2018.04.30 දින පැවති මණ්ඩලීය රැස්වීමේදී වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. | ක්‍රියාකාරි තත්වයකට පත් කිරීමට |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දින වන විටත් රු. 6,984,350 වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 06 ඉටු කර නොතිබුණි. | ප්‍රසම්පාදන කාර්යයන් ඉටු නොවීමට හේතු පහත දක්වා ඇත.<br>නවදිගන්ත මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතිය - තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ප්‍රමාද වීම මත සිදු වූ අතර එය 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැළැස්ම තුළ අන්තර්ගත කර මේ වන විට අදාළ කාර්ය නිම කර ඇත.<br>මහනුවර මධ්‍යස්ථානයේ පිළ අලුත්වැඩියා කිරීම - මෙම කාර්යය 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැළැස්ම තුළ අන්තර්ගත කර මේ වන විට අදාළ කාර්ය නිම කර අදාළ මුදල් ගෙවා ඇත.<br>මහනුවර මධ්‍යස්ථානයේ ජල කරාමය සහිත බේසම් සවි කිරීම - මේ සඳහා ලැබුණු මිළ ගණන් වල දෝෂ මත, මිළ ගණන් විවෘත කිරීමේ කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇත.<br><br>ගාල්ල මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතිය - මෙම කාර්යය සඳහා කිසිඳු ලංසුවක් ඉදිරිපත් වී නොමැත.<br>රසායනාගාරයේ දත්ත පද්ධතිය - තාක්ෂණික ඇගයීම් කමිටුවට සුදුසු නිළධාරියෙකු සොයා ගැනීමේ අපහසුව මත හා අවසාන පිරිවිතර සකස් කර ගැනීමේ ප්‍රමාදය මත මෙම කාර්යය සිදු කිරීමට නොහැකි විය.<br>Narcotic Trace Detector - මෙම අයිතමයේ වටිනාකම රු. 3,800,000/- ක් වන අතර සැපයුම්කරු විසින් ණයවර ලිපියක් මඟින් ගෙවන ලෙස දන්වා ඇත. මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් මුදල් නොලැබීම මත මණ්ඩලයේ ජංගම ගිණුම තුළ ඉහත මුදල නොතිබූ නිසා ණයවර ලිපිය විවෘත කිරීමට නොහැකි විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීම |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව පරිගණක 34 ක් මිලදී ගැනීම් සඳහා පෞද්ගලික ආයතනයකට ටෙන්ඩරය පිරිනමා තිබුණි. නමුත් ආයතනයේ තොග නොමැති වීම හේතුවෙන් පරිගණක 6 ක් පමණක් රු. 530,250 කට ලබා දීමෙන්, කාර්ය සාධන සුරක්ෂණය බැඳීමේ වගකිම පිළිබඳ සැපයුම්කරු දැනුවත් කිරීමකින් තොරව සහ ආයතනය හා එකඟ වූ පොදු කොන්දේසි අංක 09 හා අදියර III (Section III) එකඟ වීම් නොසලකා හැර තිබුණි . | විගණන නිරීක්ෂණ පිළිගනිමි. ප්‍රසම්පාදන කටයුතු 2018/02/16 දින තෙක් පැවරී තිබුණේ පාලන අංශයට වන අතර ඉන්පසු කළමණාකරණ තීරණයක් මත එහි ප්‍රාග්ධන කොටස ගිණුම් අංශය වෙත පැවරිණි. එතැන් සිට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට අදාළ අංශය දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීම |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 339 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 240 ක් වූයෙන් සේවකයින් 99 ක පුරප්පාඩු ඇති වී තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය සඳහා පුරප්පාඩු වූ සේවක සංඛ්‍යාවෙන් 10 දෙනෙකු 2018 වර්ෂය සඳහා බඳවා ගැනීමට 2018 ඔක්තෝබර් 19 දින අනුමැතිය ලබා දී තිබුණද මණ්ඩලය විසින් එකී පුරප්පාඩු පුරවා නොතිබුණි. | 2018 වර්ෂය සඳහා කළමනාකාර සහකාර 5 දෙනෙකු සහ උපදේශන සහකාර 05 දෙනෙකු බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2018.08.30 දින අනුමැතිය ලැබී තිබිණ. ඒ අනුව ඉහත පුරප්පාඩු පිරවීම සඳහා 2018.09.28 දින මණ්ඩලීය නිල වෙබ් අඩවියේ දැන්වීම් පලකර අයදුම්පත් කැඳවන ලදී. අනතුරුව අප මණ්ඩලය 2018 අවසාන කාර්තුවේදී සිදු වූ දේශපාලන අස්ථාවරභාවය නිසා සහ අමාත්‍යාංශ වෙනස්වීම මත බඳවා ගැනීම් ගැටලු සහගත විය. අප මණ්ඩලය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ බව ස්ථිර වූ පසුව 2019 ජනවාරි මස දී සම්මුඛ පරීක්ෂණ පවත්වා තේරී පත්වූ, කළමනාකරණ සහකාර 5 ක් සහ උපදේශන සහකාර 04 දෙනෙකු 2019.03.05 සිට සේවයට බඳවාගෙන ඇත. | කඩිනමින් පුරප්පාඩු පුරවා ඉහළ කාර්ය සාධනයක් ලබා ගැනීමට |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ මණ්ඩලයේ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණන කාර්යයන් 7ක් යටතේ සැලසුම් කර තිබුණද ඉන් කිසිදු කාර්යයක් ඉටුකර නොතිබු අතර 2018 වර්ෂයේ මණ්ඩලය වෙත යොමුකරන ලද ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම් 17න් 2කට පිළිතුරු සැපයිමත්, විගණන හා කළමණාකාරණ කමිටු 4 ක් සංවිධානය කිරීමත්,සේවක පැමිණීම සම්බන්ධව එක් විගණන විමසුමක් ඉදිරිපත් කිරීමත් කර තිබු අතර 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.576,469 ක මුදලක් ගෙවා තිබුණි. | මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු පරීක්ෂා කිරීම සඳහා නීතිය හා සාමය අංශයේ අතිරේක ලේකම්ගේ අංක COPE/2019/01 දරන 2019.05.27 දිනැති ලිපිය මඟින් කමිටුවක් පත් කර ඇති අතර එම වාර්තාව මසක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපියක් එවා ඇත. එසේම එහි පිටපතක් ඔබගේ දැනගැනීම සඳහා යොමු කර ඇති අතර එම වාර්තාව ලැබුණු පසු මේ සඳහා නිශ්චිත පිළිතුරක් ලබා දීමට සටහන් කර ගතිමි. | අභ්‍යන්තර විගණනයෙන් ඉහළ කාර්ය සාධනයක් ඉටු කිරීමට |

## 4.2 අයවැය පාලනය

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා සත්‍ය වියදම් සමඟ සැසඳීමේදී වැය විෂයයන් 15 කට අදාලව සියයට සෘණ -127 සිට සියයට 75 ක් දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි | මණ්ඩලය සඳහා පිළියෙළ කරන අයවැය ලේඛනය භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද වැය විෂයයන්ට අනුව සකස් කරන ලද අතර, වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල එම වැය විෂයන් විස්තරාත්මකව ඉදිරිපත් කිරීම මත, මෙම විචලනයන් සිදුවී ඇත. අයවැය ලේඛනය නිවැරදි ලෙස කළමණාකරණය කිරීමට මේ වන විට කටයුතු යොදා ඇත. | අයවැය ලේඛණ නිවැරදිව සකස් කිරීමට |